# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,644 — 1966 ජනවාරි 21 වැනි සිකුරාද — 1966.1.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස — අධිකරණ

(මෙහි වෙනම ගොනු කර ගත හැකි පරිදි හැම කොටසකටම අයත් එක් එක් කාණ්ඩයකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | 35 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත්කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... ... | 36 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම්

1965 නොවැම්බර් මස 26 වැනි දින අංක 14,569 දරණ, රජයේ ගැසට් පත්‍රයේ පළ කරවූ දෙයියන්දර, දෙනියාය සහ මොරවක යන සංචාරක මහෙස්ත්‍රාත් උසාවි පැවැත්වෙන දිනයන් දක්වෙන නිවේදනය මෙයින් අවලංගු කරමි.

1966 වර්ෂය තුළ ඉහත සඳහන් එම සංචාරක මහෙස්ත්‍රාත් උසාවි පැවැත් වෙන දිනයන් මෙහි පහත පළවේ.

| 1966 | දෙයියන්දර | දෙනියාය | මොරවක |
|---|---|---|---|
| ජනවාරි | 7, 21 | 27 | 28 |
| පෙබරවාරි | 11, 25 | 26 | 27 |
| මාර්තු | 4, 18 | 27 | 28 |
| අප්‍රියෙල් | 9, 24 | 25 | 26 |
| මැයි | 16, 31 | 24 | 25 |
| ජූනි | 7, 22 | 15 | 16 |
| ජූලි | 7, 21 | 22 | 23 |
| අගෝස්තු | 13, 20 | 21 | 22 |
| සැප්තැම්බර් | 11, 18 | 26 | 27 |
| ඔක්තෝබර් | 11, 18 | 26 | 27 |
| නොවැම්බර් | 9, 16 | 24 | 25 |
| දෙසැම්බර් | 9, 16 | 17 | 18 |

ඇල්. අශෝක ගුණවර්ධන,
මාතර මහෙස්ත්‍රාත්.

1966 ජනවාරි මස 4 වැනි දින,
මාතර මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

1–497

## විශෙෂ නිවේදනයයි

1966 ජනවාරි මස 24 සහ 28 ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1966 පෙබරවාරි 3 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1966 ජනවාරි 27 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජනවාරි 21 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### නිවැරදිකිරීමයි

1965 දෙසැම්බර් 10 වැනි දින අංක 14581 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ II. වැනි කොටසේ 160 වැනි පිටුවේ පළවී ඇති මහනුවර දිස්ත්‍රික් උසාවියේ අංක පී/1346 දරණ වෙන්දේසි දැන්වීමේ වෙන්දේසි දිනය එහි පළවී ඇති ප්‍රකාර 1965 ජනවාරි මස 10 වැනි දින කොට "1966 ජනවාරි මස 10 වැනි දින" කියා කියවිය යුතුයි.

12-492

---

### දකුණු පළාත

### කොළඹ දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

හෝමාගම්/ඇම්. ජී. ආර්ලිස් සිල්වා ................ පැමිණිලිකාරයා.
නො. 52315/ඇම් එදිරිව
අම්පාරේ, විදුලිබල මධ්‍යස්ථානයේ එච්. ඒ. ඇලෙක්සැන්ඩර්ගේ බූදලේ බලකාරයා වන කඩවත ආරච්චිගේ කරෝලිස් අප්පුහාමි ............................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රුපියල් 1,800 ක් සඟ ගාස්තුද වෂී 1966 ක්වූ පෙබරවාරි මස 22 දින උදය 10 පැයට පටන්ගෙන එම ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කේ, වැලිගම් කෝරළේ, කොහුණුගමුවේ පිහිටි කුන්ඩුම්බියා වත්තේ නො. 5 දරණ කැබැල්ලට මායිම් :—උතුරට : හොරකගහදෙනිය සහ උණගස්දෙනිය, නැගෙනහිරට : එම ඉඩමේ 5ඒ, දකුණට : උස්ගොඩතැන්න නොහොත් ගෝනතෙපොල, බස්නාහිරට : එම ඉඩමේ නො. 3 සහ 4 දරණ කැබැලි යන මායිම් තුළ පිහිටි රූඩ් 1, පර්චස් 23ක් විශාල නො. 5 දරණ කැබැල්ල.

2. ඉහතකී කොහුණුගමුවේ පිහිටි කුන්ඩුම්බියා වත්තේ නොම්මර 3 දරණ කැබැල්ලට මායිම් :—උතුරට : ගොරෝග්ගහදෙනිය නොහොත් උණගස්දෙනිය, නැගෙනහිරට : එම ඉඩමේ නො. 5, දකුණට : එම ඉඩමේ නො. 4, බස්නාහිරට : එම ඉඩමේ නො. 1 යන මායිම් තුළ රූඩ් 2, පර්චස් 24ක් විශාල නොම්මර 3 දරණ කැබැල්ල.

වෂී 1966 ක්වූ ජනවාරි මස 10 වෙනි දින, මාතර පිස්කල් කන්තෝරුවේ දිය.

ඞී. ටී. සහබන්ධු, අතිරේක නියෝජ්‍ය පිස්කල්.

1-998

---

### කිරින්ද ගම්බද පළාතේ නඩු ශාලාවේදීය

කඹුරුපිටිය ගම්කායර් සභාවේ ආදායම් ඕවර්සියර්..... පැමිණිලිකාරයා.
නො. 3801 එදිරිව
වලකන්දේ, ඇස්. විදානගම ........................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රු. 63 80ක් අයකර ගැනීම සඳහා වෂී 1966 ක්වූ පෙබරවාරි මස 23 දින උදේ 10 පැයට එම ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගඟබොඩ පත්තුවේ වලකන්දේ පිහිටි උතුරට : හොරකුඹුරිය, නැගෙනහිරට : දෙලවත්ත, දකුණට : රජයේ දෙල සහ බස්නාහිරට : රඹු දෙනිය නොහොත් ඉත්තබඩේගෙ ඉඩම යන මායිම් තුළ පොල්ගහ ආර දෙනිය නමැති අක්කර 29ක් විශාල ඉඩම වේ.

ඞී. ටී. සහබන්ධු,
මාතර අතිරේක නියෝජ්‍ය පිස්කල්.

වෂී 1966 ජනවාරි මස 12 වැනි දින,
මාතර නියෝජ්‍ය පිස්කල් කන්තෝරුවේ දිය.

1-79

---

### මාතර දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

මාතර පල්ලිමුල්ලේ සිට දැනට ගල්කිස්සෙ ගාලු පාරේ අංක 523 දරණ ස්ථානයේ පදිංචි මාතුපාල ගුණවර්ධන.......... පැමිණිලිකාරයා.
නො. ඇම්. ඇස්. 83. එදිරිව
තෙලිජ්ජවිල, කුමාරදාස වත්තේ, කුමාරදාස කරුණානායක ............................................................ විත්තිකරු.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රුපියල් 14,681.3[illegible] සහ ගෙවනා තුරු නීති පොලියද අයකරගැනීම පිණිස වෂී 1966 ක්වූ පෙබරවාරි මස 16 දින උදය 10 පැයට පටන්ගෙන එම ඉඩම්වල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කේ, වැලිගම් කෝරළේ, ඇල්ගිරියේ සහ හොරගොඩ පිහිටි පී.පී. 185429 දරණ ප්ලෑනයේ සඳහන් කොණ්ඩමණ්ඩියහේන සහ බිබිල්ලමුල්ලෙහේන සහ එහි තිබෙන තේ වගාව සහ ගොඩනැගිලි සහ ගහකොළ සමග බිමෙන් නොබෙදෙකෙන් පංගුව මායිම් :—උතුරට : පී.පී.ඇස්. 91394, 115031, 7160 සහ ගහලමුල්ලෙ අරඹද, නැගෙනහිරට : වතුර පාර සහ රාජසන්තක බැද්දද, දකුණට : රාජසන්තක ඉඩම හා වතුර පාරද, වැසියන් අයිතිකම් කියන ඉඩමුද, පී.පී.ඇස්. 119340, 73858, ලව 71576 ද, බස්නාහිරට පී.පී.ඇස් 160310, 171648, 185428, 160884 සහ 160885 ද, වැසියන් අයිතිකම් කියා සිටින ඉඩමද මෙකී මායිම් තුළ අක්කර පනස් හයයි රූඩ් දෙකයි, පර්චස් හයක් (අ. 56, රූ. 2. ප. 6) විශාල ඞී 270/1[illegible] යන්නෙන් ලියාපදිංචි කරන ලද ඉඩම වේ.

2. ඉහතකී වැලිගම් කෝරළේ හොරගොඩ පිහිටි පී.පී. නොම්මර 20877 ප්ලෑනයේ සඳහන් ඞී 207/289 දරණ නෝමරයෙන් ලියාපදිංචි කර තිබෙන අක්කර විසි දෙකයි, රූඩ් එකයි, පර්චස් දහයක් (අ. 22 රූ. 1, ප. 10) විශාල කොට්ටම්මුල්ලෙහේනට මායිම් :—උතුරට : පී.පී. 171680 ද, නැගෙනහිරට : පී.පී. 208425 ද රාජසන්තක ඉඩමද, වැසියන් අයිතිකම් කියා සිටින ඉඩමද ; දකුණට : පී.පී. 5757 සඳහන් ලොට් 553 සහ තුන්දොල දිගේ අත්හරින ලද බිම්වාසියද, බස්නාහිරට : පී.පී. 5757 තේ ලොට් 14016 සහ වැසියන් අයිතිකම් කියා සිටින ඉඩමද, මෙහි තුළ වවා තිබෙන තේ වගාව සහ එහි තිබෙන ගොඩනැගිලි හා සම්පූර්ණ බිම් වාසියද යනුයි.

1966 ක්වූ ජනවාරි මස 12 වෙනි දින, මාතර පිස්කල් කන්තෝරුවේ දීය.

ඞී. ටී. සහබන්ධු, අතිරේක නියෝජ්‍ය පිස්කල්.

1-999

---

### ගාල්ලේ දිස්ත්‍රික් නඩු ශාලාවේ දී ය

නුවර, ට්‍රිනිටි විද්‍යාලයේ මේට්‍රන් නිවාසයේ/ස්ටෙලා තිලකරත්න ................................ පත්කරන ලද පැමිණිලිකාරිය.
නොම්මරය : ඇස්. 2322. එදිරිව
මාතර, සුප්‍රිම් උසාවියේ නීතිඥ සහ නොතාරිස් තැන්පත්, අබුබක්කර් මොහමඩ් බුහාරි ........................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වේන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් රුපියල් 2,500 සහ 1963.1.29 දින සිට ගෙවා නිදහස් වනතුරු නීති පොලිය ද සහ නඩුගාස්තු ද අයකරගැනීම පිණිස වර්ෂ 1966 ක්වූ පෙබරවාරි මස 24 දින උදය 10 පැයට එම ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර නගර සභාවතුල ගබඩා වීදියේ, කෙළින් වීදියේ පිහිටි වරිපනම් අංක 38 දරණ විජේසිංහ වලව්වේ වත්ත නොහොත් කුන්සේදුපැල වත්ත නමැති ඉඩමේ බෙදා වෙන්කරන ලද ඒ අක්ෂරය දරණ කැබැල්ලේ සී අක්ෂරය දරණ කැබැල්ලේ තිබෙන තට්ටු දෙක සහිත ගොඩනැගිල්ල ද, පිටතින් තිබෙන ගොඩනැගිලිද, ලිඳ ද, වැසිකිලියද සහ සම්පූර්ණ බිමද වේ. මායිම් උතුරට : මිදුල ; නැගෙනහිරට : පාර ; දකුණට කෙළින් වීදිය, බස්නාහිරට : පාර සහ එම ඉඩමේ අංක 5 දරණ කැබැල්ල, බිම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 10.

(ඉහත සඳහන් දේපල මාතර දිස්ත්‍රික් උසාවියේ අංක ඇම්. බී. 1483 දරණ නඩුවේ උගස් තීන්දුවට යටත්ව සහ මාතර, ප්‍රසිද්ධ නොතාරිස් තැන්පත් ඇම්. පී. ජයවික්‍රම මහතා විසින් 1962.1.1 දින සහතික කරන ලද අංක 120 දරණ උගස් ඔප්පුවටද යටත්කරය)

ඞී. ටී. සහබන්ධු,
අතිරේක නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 1966 ක්වූ ජනවාරි මස 15 වෙනි දින,
මාතර පිස්කල් කන්තෝරුවේ දීය.

1-578

## වයඹ පළාත

### කුරුණෑගල දිස්ත්‍රික් නඩු ශාලාවේ දීය

පොල්ගහවෙල කැන්දගොල්ල වත්ත පදිංචි කොල්ලුරේ අප්පු සාමිල්ලාගේ දොන් නාමසේන...........................පැමිණිලිකාරයා.

නොම්මරය 2126/එම් එදිරිව

පොල්ගහවෙල ගොඩවෙල අංක 87 පදිංචි වඩුවාවේ අතාළද අච්චිල්ලාගේ ජෝන් පතිරාජ..............................විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966ක් වූ පෙබරවාරි මස 22 දින අපරභාග 3 ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තුවේ උඩපොල ඕතොට කෝරළේ ඇපාකන්ද සහ ගොඩවෙල පිහිටි අක්කර 15ක් විශාල ගොඩවෙල වත්තට මායිම්:—උතුරට: වෙලද; නැගෙනහිරට: කුරුණෑගලට යන මහපාරද; දකුණට: එවරඩ් සිල්වාට අයිති ඉඩමේ මායිමද; බස්නාහිරට: සිංගිරිබත් ඩා ගම් ආරච්චිට අයිති ඉඩමේ ඉමද යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම නමුත් ගෙය අත්හැරය. ලියාපදිංචි කළ අංකය: එෆ්. 606/163. ආර්. ඊ. ද එස්. ජයසුන්දර ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කළ 1950.9.21 දින හා අංක 2566 සහ එස්. ඊ. අබේසූරිය ප්‍රසිද්ධ නොතාරිස්තැන සහතික කළ 1954.8.21 සහ අංක 54 දරණ උගස් ඔප්පුවලට යටත්වය.

ඇස්තිසියේ මුදල රු. 9,824.67½ක් ද, රු. 9,533.50 ට 1963.9.30 දින සිට ගෙවා නිදහස් වන තුරු නීති පොලියද, පිස්කල් ගාස්තු ආදියද අය කර ගැනීමටය.

1966.1.11 වැනි දින,
කුරුණෑගල පිස්කල් කාර්යාලය.

ලයනල් අ. පොතුහැර.
වයඹ පලාතේ පිස්කල් වෙනුවට.

1–526

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරම ඇතිවෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින සතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති හැටියට ලැබෙන සේ එවිය යුතුයි (සෙනසුරාදා දිනයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි